# හපන් පුතා ජනිත්



විල්මොට් පාර්ක් ප්‍රයිමරි පාසලේ අධ්‍යාපනය ලබන ජනිත් වෙන්ඩකෝන් පුංචි පුතා පසුගිය නොවැම්බර් 16 දා හියුම් සිටි කවුන්සිලය විසින් අධ්‍යාපන කුසලතා වෙනුවෙන් පිරිනමනු ලබන ශිෂ්‍යත්වයකින් (Education Achivement Scholarship Award) පිදුම් ලැබුවේය.

ජනිත්ට මේ සම්මානය ලැබෙන්නේ ඔහු  සියලුම අංශ වලින් පෙන්වන ලද දක්ශතා වෙනුවෙන්..විශේශයෙන්ම ඔහු අධ්‍යාපනයට සේම අනෙකුත් බාහිර කටයුතු වලදිත් ඉදිරියෙන් සිටීම සැළකිල්ලට ගැනීමෙන් පසුවය






ගුරුවරුන්ගෙ හිත් දිනාගනිමින් පැමිනි සියලු බාදක මැඩ ගනිමින් ඉතා හොඳින් ඉගෙනීමේ කටයුතු කරන ජනිත් ඉතා සුහදශීලි ශිෂ්‍යයකු ලෙසද කැපී පෙනෙයි

ජනිත්ගේ දක්ෂතා සැළකිල්ලට ගනිමින් සවුත් මොරැන් හි සෙන්ට් මේරි පුද්ගලික පාසල ලබන වසරේ සිට එම පාසලේ අධ්‍යයනය ලැබීමට ඔහු තෝරාගෙන තිබීමද විශාල ජයග්‍රහණයකි

ජනිත් සිංහල භාශාව ඉගෙන ගන්නේ බ්‍රන්ස්වික් සිංහල භාශා පාසලෙනි..

තව තවත් ඉදිරියට යන්නට ජනිත් ට සන්නසෙන් සුබපැතුම්

# අත දෙන්න පුළුවන්ද?

විපතට පත් මාධ්‍ය සගයෙකුට බිඳ වැටුණු සිය ජීවිතය නැවත ගොඩනගා ගැනීමට සන්නස පාඨකයන්ගේ අත්වැල ඉල්ලමින් තබන කෙටි සටහනකි මේ.

ඔහු නමින් නිශ්මන් රණසිංහය. දීර්ග කාලයක් සංවේදී ජනමාධ්‍යවේදියෙකු ලෙස පරෝපකාරය ප්‍රමුඛස්ථානයෙහි තබා කටයුතු කරන ඔහු මීට මාස කිහිපයකට පෙර ඇතිවූ ගංවතුර විපතින් දිවි ගලවා ගෙන තිබුණේ ඇඳිවත පමණක් උරුම කර ගනිමිනි. දරු දෙදෙනෙකුගේ පියෙකු වන ඔහුගේ පදිංචිය කැළණි ගඟ සමීපයෙහි පිහිටි කුළී නිවෙසකය. ජීවිත කාලය පුරාවට ඔහු උපයා සපයාගෙන තිබුණු සියලු දේ ගංවතුරේ ගසා ගෙන ගොස් තිබිණ. ඉතිරි වූයේ කුළී නිවෙසේ බිත්ති ටික පමණකි.



පසුව මාධ්‍ය සඟයන්ගේ මැදිහත්වීමෙන් එම නිවෙසම අලුත්වැඩියා කොට අත්‍යාවශ්‍යම ගෘහ උපකරණ කිහිපයක් සහ ඇඳුම් සපයා දී නැවතත් ඔහුට රැකියාවට යාමට හැකි වටපිටාවක් සකස් කළද බිඳවැටුණු සාමාන්‍ය ජීවිත නැවත ඇරඹීම ඔහුට බලවත් දුෂ්කර කටයුත්තක්ව තිබේ. ගංවතුර සහනාධාර ලෙස ඒ දිනවල විවිධ සංවිධාන සහ පුද්ගලයන් විසින් ලබාදුන් වියළි ආහාර ද්‍රව්‍ය හැරුණු විට මේ දක්වා ඔහුට (ඔහුට පමණක් නොව ගංවතුරින් විපතට පත් සියළු දෙනාට) රජයෙන් ලැබී ඇත්තේ රුපියල් 10,000/- සහනාධාරයක් පමණි.

ඔහුගේ දරු දෙදෙනාම පාසල් වියේ පසුවන අතර එක් දරුවෙකු විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකි. ගංවතුර විපතින් ඔහුගේ බිරියගේ අතකට හානි සිදුවීම හේතුවෙන් ඒ දරුවාගේ කටයුතු ටික කරගැනීමට පවා ඇයට නොහැකිව ඇත. ගෙදර තිබුණු වොෂින් මැෂින් එකද ගංවතුරේ ගසාගෙන ගිය බැවින් දරුවාගේ රෙදි ටික සෝදාගැනීම පවා දුෂ්කර කටයුත්තක් බවට පත්ව ඇතැයි ඔහු අප හා පැවසීය. ගංවතුර විපතක සැබෑ විනාශය කවරාකාරද යන්න පිළිබඳ දැනගැනීමට මේ සමඟ ඇති ඡයාරූප ඔබට උපකාර වනු ඇත.

ඔහුගේ නිවෙසට අවශ්‍ය ගෘහ උපකරණ යම් කිසි ප්‍රමාණයක් හෝ ලබාදීමට කිසියම් පරිත්‍යාගශීලියෙකුට, කණ්ඩායමකට, සංවිධානයකට හැකියාවක් ඇත්නම් එය මහත් උපකාරයක් පමණක් නොව පුන්‍යකර්මයක්ද වන්නේය. අලුත්ම ඒවාම අවශ්‍ය නොවන බවත් පාවිච්චි කළ ඒවා වුවත් මේ අවස්ථාවේ අතිශය ප්‍රයෝජනවත් බවත් ඔහු පවසයි.

ඔහු පිළිබඳ මීට පෙර ජනමාධ්‍ය ඔස්සේ අප තැබූ සටහනක ඔහුගේ දුරකථන අංකය ඇතුළත් කිරීමෙන් පසු විෂම චර්යා සහිත පුද්ගලයන් එම අංකයට කතා කරමින් ඔහුව මානසික හිරිහැරයකට පත්කරනු ලැබ තිබුණු බැවින් එම අංකය මෙහි ඇතුළත් නොකරන්නට තීරණය කළෙමු. එහෙත් සන්නස කාර්යාලයට හෝ කර්තෘවරයා අමතා අවශ්‍ය වැඩිදුර විස්තර දැනගැනීමටත් සිය පරිත්‍යාග ඔහු වෙත යොමු කිරීමටත් පරිත්‍යාගශීලීන්ට හැකිය.

-ශ්‍රීලාල් සෙනෙවිරත්න

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
WARNALEGAL
Justice for all
1/44 King Street Dandenong VIC 3175
03 9701 3718
info@warnalegal.com
warnalegal1